සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

27626

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/ இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 1999 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 1999 ஆகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 1999

# සත්ත්ව විද්‍යාව I
# விலங்கியல் I
# Zoology I

| 04 | |
|---|---|
| S | I |

පැ දෙකයි / இரண்டு மணித்தியாலங்கள் / Two hours

උත්තර පත්‍රයේ දක්වා ඇති ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
මෙම පත්‍රයේ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයීමට ඔබ වෑයම් කළ යුතුයි.

එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහක්** ඇති නමුදු නිවැරදි වන්නේ ඉන් **එකක්** පමණකි. ප්‍රශ්නයට **හොඳම පිළිතුර** හැටියට ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය උත්තර පත්‍රයේ දක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න. වඩා පහසු ප්‍රශ්නවලට පළමුවෙන් පිළිතුරු දෙන්න. කිසියම් ප්‍රශ්නයක් බොහෝ අපහසු බව හැඟුනහොත් එය මඟහැර කාලය ඉතිරිවුවහොත් පසුව සලකා බැලීමට කල් තබන්න.

---

1. පහත සඳහන් මූලද්‍රව්‍ය අතුරෙන් සියලු ම ප්‍රෝටීනවල සංඝටකයක් වනුයේ කුමක් ද?
   (1) කැල්සියම් (2) නයිට්‍රජන් (3) ෆොස්ෆරස් (4) සල්ෆර් (5) යකඩ

2. පහත සඳහන් ඒවා අතුරෙන් ග්ලූකෝස් ඒකකවලින් පමණක් සෑදී **නොමැත්තේ** කුමක් ද?
   (1) සෙලියුලෝස් (2) මෝල්ටෝස් (3) පිෂ්ටය (4) සුක්‍රෝස් (5) ග්ලයිකොජන්

3. සත්ත්ව සෛලවල ගොල්ජි දේහය පිළිබඳ ව **අසත්‍ය** වගන්තිය වනුයේ කුමක් ද?
   (1) එය පැතලි මඩි සහ ආශයිකා සාණ්ඩයකි.
   (2) එය කාබොහයිඩ්‍රේට සංශ්ලේෂණය කරයි.
   (3) එය ප්‍රෝටීන ඇසිරීම සඳහා ඉවහල් වේ.
   (4) එය ත්‍රෛස්ථ ආවරණයෙන් සෑදේ.
   (5) එය කලස් සෛලවල හොඳින් විකසනය වී ඇත.

4. සත්ත්ව සෛලවල, ග්ලයිකොලිසිය
   (1) නිර්වායු ක්‍රියාවලියකි.
   (2) මයිටොකොන්ඩ්‍රියම් තුළ සිදු වේ.
   (3) සඳහා ශක්තිය අවශ්‍ය නොවේ.
   (4) ග්ලූකෝස් අණුවක් පයිරුවේට් අණුවකට හරවයි.
   (5) NAD නිපදවයි.

5. පහත සඳහන් මිනිසාගේ සෛල අතුරෙන් දීර්ඝ ම ජීවිත කාලයක් ඇත්තේ කුමකට ද?
   (1) රක්තාණුව (2) ශ්වේතාණුව (3) ආමාශයික සෛලය
   (4) අස්ථි සෛලය (5) ස්නායු සෛලය

6. ආලෝක අන්වීක්ෂයෙහි උපරිම විභේදනය
   (1) 0·1 μm ය. (2) 0·2 μm ය. (3) 0·4 μm ය. (4) 0·8 μm ය. (5) 1·2 μm ය.

7. සාමාන්‍ය නිරෝගී වැඩිහිටි පුද්ගලයකු විවේකී ව සිටින විට, වැඩිම ඔක්සිජන් අවශ්‍යතාවයක් ඇත්තේ පහත සඳහන් සෛල අතුරෙන් කුමකට ද?
   (1) නියුරෝනය (2) කංකාල පේශි තන්තුව (3) අපිච්ඡද සෛලය
   (4) ඩිම්බය (5) ශුක්‍ර සෛලය

8. කිකිළියකගේ සංසේචිත ඩිම්බය බිජුලන අවස්ථාවේ දී
   (1) හැඩයෙන් අණ්ඩාකාර ය.
   (2) මිනිස් පියවි ඇසට නොපෙනේ.
   (3) දුව සහ උස්ප්‍රාවී ඇල්බියුමන් දරයි.
   (4) බහුලාන්ත වේ.
   (5) දෙවන ඌනන විභාජනය සම්පූර්ණ කර නැත.

9. මැඩියාගේ කලල විකසනයේ දී, පළමුවන, දෙවන, තුන්වන සහ හතරවන ඡේදන තල, පිළිවෙළින්
(1) ආයාම, අක්ෂාංශ, ආයාම සහ ආයාම වේ.
(2) ආයාම, ආයාම, අක්ෂාංශ සහ ආයාම වේ.
(3) අක්ෂාංශ, ආයාම, අක්ෂාංශ සහ ආයාම වේ.
(4) අක්ෂාංශ, අක්ෂාංශ, ආයාම සහ අක්ෂාංශ වේ.
(5) ආයාම, ආයාම, ආයාම සහ අක්ෂාංශ වේ.

● ප්‍රශ්න අංක **10** සහ **11** පදනම් වී ඇත්තේ පහත දක්වෙන මැඩියෙකුගේ කලලයෙහි රූප සටහන මත ය.




10. රූප සටහනෙන් නිරූපණය වන කලල අවධිය වනුයේ
(1) මුල් බ්ලාස්ටුලාවා ය.
(2) පසු බ්ලාස්ටුලාවා ය.
(3) මුල් ගැස්ට්‍රුලාවා ය.
(4) පසු ගැස්ට්‍රුලාවා ය.
(5) සම්පූර්ණ වූ ගැස්ට්‍රුලාවා ය.

11. රූප සටහනෙහි Z ලෙස සලකුණු කර ඇති ප්‍රදේශය, අනාගත
(1) ස්නායු මාර්ග ඵලකය යි.
(2) අපිචර්මය යි.
(3) පෘෂ්ඨරජ්ජුව යි.
(4) අන්තශ්චර්මය යි.
(5) මධ්‍යචර්මය යි.

12. පහත සඳහන් ඒවා අතුරෙන් සත්ත්ව සෛලයක පළමු ඌනන විභාජනයේ දී සිදු **නොවනුයේ** කුමක් ද?
(1) වර්ණදේහ සංඛ්‍යාව අඩු වීම
(2) න්‍යෂ්ටිකාව නොපෙනී යාම
(3) සමප්‍රභව වර්ණදේහ යුගලනය වීම
(4) සෛලයේ ප්‍රතිවිරුද්ධ ධ්‍රැවවලට දුහිතෘ වර්ණදේහාංශ පර්යටනය වීම
(5) වර්ණදේහ තර්කුව මත පිළියෙළ වීම

13. සාමාන්‍ය දෘෂ්ටිය සහිත පුරුෂයකු සහ වර්ණ අන්ධතාවය සඳහා වාහක ගැහැණියක අතර මුහුම්කින් $F_1$ පරම්පරාවේ පුද්ගලයන්ගේ බලාපොරොත්තු විය හැකි රූපානුදර්ශ විය හැක්කේ
(1) සියල්ලන් ම වර්ණ අන්ධය.
(2) 25% ක් වර්ණ අන්ධ සහ 75% ක් සාමාන්‍ය දෘෂ්ටිය ඇත්තන් ය.
(3) 50% ක් වර්ණ අන්ධ සහ 50% ක් සාමාන්‍ය දෘෂ්ටිය ඇත්තන් ය.
(4) 75% ක් වර්ණ අන්ධ සහ 25% ක් සාමාන්‍ය දෘෂ්ටිය ඇත්තන් ය.
(5) සියල්ලන් ම සාමාන්‍ය දෘෂ්ටිය ඇත්තන් ය.

14. මිනිසාගේ රක්තාණුවක හැඩය ඇලීල දෙකක් මගින් නිර්ණයවන මෙන්ඩලීය ලක්ෂණයකි. සාමාන්‍ය හැඩැති රක්තාණු, දෑකැති හැඩැති රක්තාණුවලට ප්‍රමුඛ වේ. සාමාන්‍ය හැඩැති රක්තාණුවක් සඳහා ඇලීලය **R** වන අතර දෑකැති හැඩැති රක්තාණුවක් සඳහා ඇලීලය **r** වේ. සාමාන්‍ය හැඩය ඇති රක්තාණු සහිත දෙමව්පියන්ට දෑකැති සෛල රක්තහීනතාවය ඇති දරුවකු බිහි වුනි නම්, දෙමව්පියන්ගේ ප්‍රවේණි දර්ශ විය හැක්කේ
(1) RR සහ RR ය.
(2) RR සහ rr ය.
(3) RR සහ Rr ය.
(4) Rr සහ Rr ය.
(5) Rr සහ rr ය.

15. ලක්ෂණ දෙකක් සඳහා විෂමයුග්මකවන පුද්ගලයන් අතර මුහුම්කින්, මෙන්ඩලීය ප්‍රවේණිය අනුව $F_1$ පරම්පරාවේ බලාපොරොත්තු විය හැකි සමයුග්මක නිලීන පුද්ගලයන්ගේ භාගය වනුයේ
(1) $\frac{12}{16}$ කි.
(2) $\frac{9}{16}$ කි.
(3) $\frac{4}{16}$ කි.
(4) $\frac{3}{16}$ කි.
(5) $\frac{1}{16}$ කි.

16. පරම්පරා ප්‍රත්‍යාවර්තනය දැකිය හැකි වංශය වනුයේ
(1) එපිතොම්ප්ලෙක්සා ය.
(2) සීලෙන්ටෙරාටා ය.
(3) මොලුස්කා ය.
(4) එකිනොඩර්මටා ය.
(5) ආත්‍රොපොඩා ය.

17. ස්පර්ශක යුගල් දෙකක් ඇත්තේ
(1) කෑමීන්ට ය.
(2) ක්‍රස්ටාසෙයාවන්ට ය.
(3) පත්තෑයන්ට ය.
(4) මකුළුවන්ට ය.
(5) හැකරැල්ලන්ට ය.

18. ජීවන චක්‍රයේ විලිජර් කීටයකු ඇතුළත් වී ඇත්තේ කුමන සත්ත්ව කාණ්ඩයට ද?
(1) සීලෙන්ටෙරාටාවන් (2) ඇනෙලිඩාවන් (3) මොලුස්කාවන්
(4) එකිනොඩර්මටාවන් (5) නෙමටෝඩාවන්

19. මොලුස්කාවන් මිනිසාට ආර්ථික ව වැදගත් **නොවන්නේ**
(1) හුනු සඳහා ප්‍රභවයක් ලෙස ය. (2) කෘෂි පළිබෝධයින් ලෙස ය. (3) ආහාර ලෙස ය.
(4) මුතු සඳහා ප්‍රභවයක් ලෙස ය. (5) පරපෝෂිතයින් ලෙස ය.

20. සෑම ඇනෙලිඩාවකුට ම
(1) දඬිකෙඳි ඇත. (2) අංශපාදිකා ඇත. (3) මෙවුලක් ඇත.
(4) පැහැදිලි හිසක් ඇත. (5) වෘක්කිකා ඇත.

21. පහත සඳහන් භෝජන ක්‍රමවලින් එකක් එය ඉදිරිපිට සඳහන් කර ඇති සත්ත්ව කාණ්ඩයට අදාළ **නොවේ**. මෙම භෝජන ක්‍රමය තෝරන්න.

| **භෝජන ක්‍රමය** | **සත්ත්ව කාණ්ඩය** |
|---|---|
| (1) භක්ෂසෛලකතාව | ඇමීබාවන් |
| (2) පෙරා බුදීම | ද්විකපාටිකයින් |
| (3) විද උරා බීම | මදුරුවන් |
| (4) නොවිකා ගිල දැමීම | සර්පයන් |
| (5) හැපීම සහ විකීම | මකුණන් |

22. ආත්‍රෝපෝඩාවන්ගේ ශ්වසනයට සම්බන්ධ **නොවනුයේ**
(1) ජලක්ලෝම ය. (2) ශ්වාස රුක් ය. (3) ශ්වාසනාල ය.
(4) දේහ පෘෂ්ඨය ය. (5) පත් පෙණහැලි ය.

23. පහත සඳහන් ඒවා අතුරෙන් ආත්‍රෝපෝඩා වංශයේ ආවේණික ලක්ෂණයක් **නොවනුයේ** කුමක් ද?
(1) උදරීය ස්නායු රජ්ජු යුගලක් (2) පෘෂ්ඨීය හෘදයක්
(3) සම්පූර්ණ ජීරණ පද්ධතිය (4) තිර්විලිඛිත පේශි
(5) කයිටිනීය පිටසැකිල්ල

24. සෑම පෘෂ්ඨවංශිකයකුට ම **නොමැත්තේ**
(1) කපාලයක් ය. (2) හනු ය.
(3) මයලිනීභූත ස්නායු තන්තු ය. (4) ජිහ්වාවක් ය.
(5) ආක්ෂක ඇටසැකිල්ලක් ය.

25. පහත සඳහන් ලක්ෂණ අතුරෙන් කොන්ඩ්‍රික්තියෙස් වර්ගයේ සාමාජිකයින් අතර පමණක් දක්නට ලැබෙනුයේ කුමක් ද?
(1) රළු කොරල (2) කුටීර දෙකක් සහිත හෘදය (3) මධ්‍යවෘක්ක
(4) කපාල ස්නායු යුගල් දහයක් (5) ග්‍රසනික ජලක්ලෝම

26. පක්ෂීහු
(1) ඔවුන්ගේ දේහ උෂ්ණත්වය යාමනය කරති.
(2) අපරකපාල සන්ධාන අග්‍ර දෙකක් සහිත හිස් කබල් දරති.
(3) ප්‍රධාන නයිට්‍රජනීය අපද්‍රව්‍ය ලෙස යූරියා බහිස්‍රාවය කරති.
(4) ක්‍රියාකාරී ඩිම්බකෝෂ දෙකක් දරති.
(5) කොරපොතු නොදරති.

27. නිවැරදි වගන්තිය තෝරන්න.
(1) ආහාර දමයක පළමුවෙනි පෝෂී මට්ටම සැමවිට ම ප්‍රභාසංශ්ලේෂක ජීවියෙකු ය.
(2) පරිසර පද්ධතියක යම් සත්ත්වයකු සැමවිට ම අයත් වනුයේ එක් පෝෂී මට්ටමකට පමණි.
(3) ආහාර දමයක් ඔස්සේ බැර ලෝහ රැස් වේ.
(4) ආහාර දමයක් සෑදීමට අවම වශයෙන් පෝෂී මට්ටම් දෙකක් අවශ්‍ය වේ.
(5) ශක්තිය එක් පෝෂී මට්ටමක සිට අනෙකට ගලා යෑමේ දී එහි 10% ක හානියක් සිදු වේ.

28. සත්ත්වයකුගේ නිකේතනය
(1) මොහු ජීවත්වන ස්ථානය යි.
(2) පරිසර පද්ධතියක් තුළ මොහුගේ කාර්යභාරය යි.
(3) වෙනත් විශේෂයක නිකේතනය සමග කිසිවිටෙක අතිපිහිත නොවේ.
(4) විකසන අවස්ථාව අනුව වෙනස් නොවේ.
(5) මොහුගේ භෝජන විලාසය මගින් නිර්ණය නොවේ.

27626

29. උභයජීවීන් වාසය **නොකරන්නේ**
(1) වැව්වල ය. (2) වනාන්තරවල ය. (3) තණ බිම්වල ය.
(4) ඇළවල්වල ය. (5) සමුද්‍රවල ය.

30. පහත සඳහන් ඒවායින් හරිතාගාර වායුවක් **නොවන්නේ** කුමක් ද?
(1) මීතේන් (2) ඕසෝන් (3) කාබන් ඩයොක්සයිඩ්
(4) හයිඩ්‍රජන් (5) නයිට්‍රස් ඔක්සයිඩ්

31. පහත සඳහන් ලක්ෂණ අතුරෙන් මිනිසා ඇන්ත්‍රොපොයිඩියා උපගෝත්‍රය යටතේ වර්ගීකරණය කිරීම සඳහා භාවිත කරනුයේ කුමක් ද?
(1) පහළට යොමු වූ මහා ඡිද්‍රය (2) ඇසෙහි අක්ෂිකූපය වටා පිහිටි අස්ථි වලය
(3) ද්වි ශීර්ෂ පර්ශු (4) ඇඟිලිවල ඇති පැතලි නිය (5) පත්‍රාකාර කෘන්තක

32. මිනිස් ඇසෙහි, යෂ්ටි
(1) මධ්‍ය කූපයෙහි පිහිටා ඇත. (2) ආලෝකයට අධික ලෙස සංවේදී ය.
(3) අධික දෘෂ්ටි තීක්ෂණතාවයකින් යුක්ත ය. (4) වර්ණ දෘෂ්ටිය හා සම්බන්ධ ය.
(5) කේතුවලට වඩා සංඛ්‍යාවෙන් අඩු ය.

33. මිනිස් කනෙහි, ඇසීම හා සම්බන්ධ සංවේදක සෛල ඇත්තේ
(1) කර්ණපටහ පටලය මත ය. (2) ටෙක්ටම් පටලය මත ය. (3) පාදශු පටලය මත ය.
(4) කුම්බිකාව මත ය. (5) කුම්භිකාව මත ය.

34. මිනිසාගේ මස්තිෂ්කයෙහි සංවේදක කථන ප්‍රදේශය පිහිටා ඇත්තේ
(1) පාර්ශ්වික සහ ශංඛක ඛණ්ඩිකාවල ය.
(2) ශංඛක සහ අපරකපාල ඛණ්ඩිකාවල ය.
(3) පාර්ශ්වික සහ අපරකපාල ඛණ්ඩිකාවල ය.
(4) ලලාට සහ ශංඛක ඛණ්ඩිකාවල ය.
(5) ලලාට සහ පාර්ශ්වික ඛණ්ඩිකාවල ය.

35. මිනිසාගේ ස්නේහස්‍රාවී ග්‍රන්ථිය
(1) දහර ගැසී ඇත. (2) උෂ්ණත්වයාමනයෙහි ලා දායක වේ.
(3) සම වියළීයාම වළක්වයි. (4) නයිට්‍රජනීය බහිස්‍රාවය හා සම්බන්ධ ය.
(5) රෝමෝද්ගාමක පේශියට සම්බන්ධ වී ඇත.

36. පහත සඳහන් වගන්ති අතුරෙන් මිනිස් ශුක්‍රාණුව පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද?
(1) එය තනි ලයිසොසෝමයක් දරයි.
(2) එහි මයිටොකොන්ඩ්‍රියා කීපයක් ඇත.
(3) එහි න්‍යෂ්ටියෙහි අලිංගවර්ණදේහ 23 ක් ඇත.
(4) ස්ත්‍රියකුගේ ප්‍රජනක පද්ධතිය තුළ එහි සරු කාලය දින තුනක් පමණ වේ.
(5) ටෙස්ටොස්ටෙරොන් මගින් එහි සෑදීම යාමනය කරයි.

37. පහත සඳහන් ඒවා අතුරෙන් මිනිසාගේ වසා පද්ධතිය පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද?
(1) ප්ලීහාව වසා අවයවයකි.
(2) එහි වාහිනීවල කපාට ඇත.
(3) එය අන්තරාල තරල පරිමාව යාමනය කිරීමට උපකාරී වේ.
(4) එය ප්‍රතිශක්තියෙහි ලා වැදගත් මෙහෙයක් ඉටු කරයි.
(5) එය ආහාර මාර්ගයෙහි ඇමයිනෝ අම්ල අවශෝෂණය හා සම්බන්ධ ය.

38. පහත සඳහන් ඒවා අතුරෙන් මිනිසාගේ අතේ මාපටැඟිල්ල පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද?
(1) එය ත්‍රපීසොයිඩය සමඟ සන්ධානය වේ.
(2) එයට ඇඟිලි පුරුක් දෙකක් ඇත.
(3) එය අත් ඇඟිලි සමඟ පිළිමල් වේ.
(4) එය අතෙහි කාර්යක්ෂමතාව බෙහෙවින් වැඩි කරයි.
(5) එහි චලනයන් දෛහික ස්නායු පද්ධතිය මගින් යාමනය වේ.

39. පහත සඳහන් ඒවා අතුරෙන් නිරෝගී වැඩිහිටි මිනිසකුගේ උරස් කශේරුකා පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද?
(1) ඒවා සියල්ල ම ප්‍රමාණයෙන් සමාන වේ.
(2) කශේරුවෙහි උරස් කශේරුකා 12 ක් ඇත.
(3) ඒවායෙහි තිර්යක් ප්‍රසරවල ඡිද්‍ර නොමැත.
(4) කශේරුවෙහි ප්‍රාථමික වක්‍රය සෑදීම සඳහා ඉවහල් වේ.
(5) ඒවායෙහි තිර්යක් ප්‍රසරවල සහ කශේරුකා දේහවල සන්ධාන මුහුණත් ඇත.

40. මිනිසාගේ මුත්‍රධර නාලිකාවක, ශුච්ඡිකා පෙරනයෙහි පරිමාවේ විශාල අඩුවීමක් සිදුවනුයේ
(1) අවිදූර සංවලිත නාලිකාවෙහි ය.
(2) හෙන්ලෙ පුඩුවේ අවරෝහණ බාහුවෙහි ය.
(3) හෙන්ලෙ පුඩුවේ ආරෝහණ බාහුවෙහි ය.
(4) විදූර සංවලිත නාලිකාවෙහි ය.
(5) සංග්‍රාහක ප්‍රණාලයෙහි ය.

41. පහත සඳහන් වගන්ති අතුරෙන් මිනිස් ආමාශය පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද?
(1) එය පෙප්සින් ස්‍රාවය කරයි.
(2) එය ජීරණ පද්ධතියෙහි වැඩියෙන් ම ප්‍රසාරණය විය හැකි කොටස ය.
(3) එය අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ක්‍රියා කරයි.
(4) එහි විදූර කෙලවරයෙහි ආලාර චක්‍ර පිධානයක් ඇත.
(5) එය ජලය අවශෝෂණය කරයි.

42. මිනිසාගේ මහාන්ත්‍රය
(1) ලීබර්කූන් ලෙන් දරයි.
(2) විටමින් D සංශ්ලේෂණය කරන බැක්ටීරියා දරයි.
(3) අඛණ්ඩ අන්වායාම පේශි ස්තරයක් දරයි.
(4) ඛනිජ ලවණ අවශෝෂණය කරයි.
(5) ආහාර මාර්ගයෙහි දීර්ඝ ම කොටස යි.

43. මිනිසාගේ, හෘත් පේශි තන්තු
(1) බහුන්‍යෂ්ටික ය.
(2) අතුබෙදී නොමැත.
(3) දෛහික ස්නායු පද්ධතියෙන් ස්නායුකනය වේ.
(4) පේශිජන්‍ය ය.
(5) බහිශ්චර්මයෙන් සම්භවය වේ.

44. පහත සඳහන් ඒවා අතුරෙන් කාටිලේජ පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද?
(1) එය සියලු ම පෘෂ්ඨවංශීන්ට ඇත.
(2) එහි රුධිර වාහිනී නොමැත.
(3) ඒවා වර්ග තුනක් ඇත.
(4) එය සම්බන්ධක පටකයකි.
(5) එහි ගර්තිකා නොමැත.

45. පහත සඳහන් ඒවා අතුරෙන් සාමාන්‍ය නිරෝගී වැඩිහිටි මිනිසකුගේ හිමොග්ලොබින් පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද?
(1) එය ඔක්සිජන් කෙරෙහි අධික බන්ධතාවයක් දක්වයි.
(2) එහි යකඩ $Fe^{2+}$ ආකාරයෙන් ඇත.
(3) එය රක්තාණුවල සහ රුධිර ප්ලාස්මාවෙහි ඇත.
(4) එය කාබන් ඩයොක්සයිඩ් පරිවහණය කරයි.
(5) එය රුධිර pH යාමනය හා සම්බන්ධය ය.

46. මිනිසාගේ, ස්තරීභූත ශල්කමය අපිච්ඡදය
(1) අපිචර්මයෙහි පිහිටා ඇත.
(2) ස්‍රාවීය කෘත්‍යයක් ඉටු කරයි.
(3) පැතලි සෛලවලින් පමණක් සමන්විත වෙයි.
(4) ඇදෙන සුළු ය.
(5) වාහිනීමය ය.

47. මිනිසාගේ අපර පිටියුටරි ග්‍රන්ථියෙහි මන්දස්‍රාවය හා සම්බන්ධ ආබාධය වනුයේ
(1) යෝධතාවය යි.
(2) ක්‍රෙටිනතාවය යි.
(3) ගලගණ්ඩය යි
(4) මධු මේහය යි.
(5) අමිශ්‍ර මේහය යි.

48. මත්ස්‍ය වගා පොකුණක, ජලයෙහි pH අගය 5·0 ට පමණ අඩු වුවහොත්, එය මත්ස්‍යයින්ට හිතකර මට්ටමක් කරා ගෙන ආ හැක්කේ එම ජලයට
(1) යූරියා දැමීමෙනි.
(2) සෝඩියම් ක්ලෝරයිඩ් දැමීමෙනි.
(3) පිළිස්සූ හුනු දැමීමෙනි.
(4) කොපර් සල්ෆේට් දැමීමෙනි.
(5) ඇලුමිනියම් සල්ෆේට් දැමීමෙනි.

49. පහත සඳහන් වගන්ති අතුරෙන් *Wuchereria bancrofti* සහ *Necator americanus* යන දෙදෙනා ම පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද?
(1) සුහුඹුලන්ට උච්චර්මයක් ඇත.
(2) මොවුන් ජලාබුජ වේ.
(3) සංසේචනය අභ්‍යන්තර ව සිදු වේ.
(4) ගැහැණු සුහුඹුලන් පිරිමි සුහුඹුලන්ට වඩා විශාල ය.
(5) $L_3$ කීටයා ආසාදක අවස්ථාව වේ.

50. *Plasmodium vivax* ගේ යුක්තාණුව සෑදීම සිදු වනුයේ
(1) මිනිස් අක්මාව තුළ ය.
(2) ගැහැණු *Anopheles* මදුරුවාගේ මැදිබඩවැලෙහි බිත්තිය තුළ ය.
(3) මිනිස් රුධිරයේ දී ය.
(4) ගැහැණු *Anopheles* මදුරුවාගේ මැදිබඩවැලෙහි කුහරය තුළ ය.
(5) ගැහැණු *Anopheles* මදුරුවාගේ ඛේට ග්‍රන්ථි තුළ ය.

51. පහත සඳහන් වගන්ති අතුරෙන් *Entamoeba histolytica* පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද ?
(1) මොවුන් මිනිසාට අතිසාරය සාදයි.
(2) මොවුන් රයිසොපොඩා වංශයට අයත් වේ.
(3) මොවුන් කිසිවිටක මිනිස් අක්මාවේ දක්නට නොලැබේ.
(4) මොවුන් ධාරකයා තුළට ඇතුල්වනුයේ මිනිස් මලවලින් අපවිත්‍ර වූ ආහාර සහ ජලය මගිනි.
(5) මොවුන් ප්‍රධාන වශයෙන් යැපෙනුයේ මිනිස් රුධිරය මත ය.

52. ඕර්ගැනොපොස්පේට් කෘමිනාශක
(1) ශාකවලින් නිස්සාරණය කරණු ලැබේ.
(2) නියුරිලෙමාව මත ක්‍රියා කරයි.
(3) පරිසරය තුළ සීඝ්‍රයෙන් බිඳී යයි.
(4) කෘමියකුගේ ශරීරයට ඇතුල්වනුයේ උච්චර්මය හරහා පමණි.
(5) විෂ වන්නේ අපෘෂ්ඨවංශීන්ට පමණි.

53. ජෛව පාලනය
(1) පළිබෝධයන් සැණෙකින් මර්දනය කරයි.
(2) සැමවිට ම සාර්ථකය.
(3) සඳහා පළිබෝධයාගේ ජීවන ප්‍රවෘත්තිය පිළිබඳ ව දැනුමක් අවශ්‍යය ය.
(4) වන ජීවීන්ට සහ මිනිසුන්ට කිසිම අහිතකර ප්‍රතිඵලයක් නොදෙයි.
(5) සාමාන්‍යයෙන් රසායනික පාලන ක්‍රම සමඟ එකවර භාවිත කරනු ලැබේ.

54. පහත සඳහන් වගන්ති අතුරෙන් සත්ත්ව පරිණාමය පිළිබඳ ව **අසත්‍ය** වන්නේ කුමක් ද ?
(1) එය අඛණ්ඩ ව සිදුවන ක්‍රියාවලියකි.
(2) එය ගහණයක් තුළ පමණක් සිදුවේ.
(3) එය සෙමෙන් සිදුවන ක්‍රියාවලියකි.
(4) එය ගහණයක් විසංගමනය වීම නිසා සිදුවිය හැකි ය.
(5) එය මිනිස් ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් නිසා සිදුවිය නොහැක.

55. ලැමාක්ට අනුව
(1) අවයවයක් අඛණ්ඩ ව භාවිත කිරීම එහි ප්‍රමාණය මත බලපෑමක් නොකරයි.
(2) සත්ත්වයින් අතර ජීවන සටනක් ඇත.
(3) විශේෂයක ජීවකයන් එකිනෙකාගෙන් ස්වල්ප ලෙස වෙනස් වේ.
(4) සත්ත්වයකු නිපදවනු ලබන ජනිතයින්ගෙන් සුළුඹුලන් බවට පත්වනුයේ ස්වල්ප දෙනෙක් පමණි.
(5) රූපානුදර්ශීය වෙනස් වීම් ප්‍රජනිතයන්ට ප්‍රවේණි ගතවේ.

56. පහත සඳහන් ඒවා අතුරෙන් *Homo erectus* පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද ?
(1) ඔවුන්ගේ කපාල ධාරිතාව 850 - 1350 cc අතර විය.
(2) ඔවුන් ගින්දර භාවිත කළහ.
(3) ඔවුන්ගේ පොසිල චීනයෙන් සොයාගෙන ඇත.
(4) මොවුන් ශාකභක්ෂකයන් වූහ.
(5) මොවුන් ඇඳුම් භාවිත කළ ප්‍රථම හොමිනිඩියන් ය.

57. ප්‍රතිවේදනාත්මක ඉගෙනීම
(1) සියලු ම ක්ෂීරපායින්ගේ දක්නට ලැබේ.
(2) වරක් පරිචිත වූ විට ජීවිතය පුරාම පවතී.
(3) දක්නට ලැබෙන්නේ ජීවිතයේ කුඩා අවධිවල පමණි.
(4) සඳහා තර්කණය කිරීමේ හැකියාව අවශ්‍ය ය.
(5) පූර්ව අත්දැකීම් මත රඳා නොපවතී.

58. පහත සඳහන් වගන්ති අතුරෙන් සාර්වසරණය පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද ?
(1) එය ජීකායන චර්යා ආකාරයකි.
(2) එය මුළු ජීවියාගේ ම චලනය හා සම්බන්ධය ය.
(3) එය උත්තේජයේ දිශාවට සම්බන්ධතාවයක් නොදරයි.
(4) එය සිදුකිරීම සඳහා සංකීර්ණ මධ්‍ය ස්නායු පද්ධතියක් අවශ්‍ය නොවේ.
(5) එය සැමවිට ම බාහිර උත්තේජයකට දක්වන ප්‍රතිචාරයකි.

59. පහත සඳහන් වගන්ති අතුරෙන් සත්ත්ව සන්නිවේදනය පිළිබඳ ව **අසත්‍ය** වනුයේ කුමක් ද ?
(1) එය එක් සත්ත්වයකුගේ සිට තවත් සත්ත්වයකුට තොරතුරු සම්ප්‍රේෂණය වීම හා සම්බන්ධ ය.
(2) එය ප්‍රතිග්‍රාහණය කරන සත්ත්වයාගේ චර්යාවේ වෙනසක් සිදු කරයි.
(3) එය සමාජ චර්යාවන් සඳහා අත්‍යවශ්‍ය ය.
(4) එය සැමවිට ම අන්තඃවිශේෂ වේ.
(5) සත්ත්ව සන්නිවේදනයේ දී රසායනික සංඥා භාවිත කරනු ලැබේ.

60. දනට ශ්‍රී ලංකාවේ වයඹ ප්‍රදේශයේ පොල් ගස්වලට බරපතල හානියක් සිදු කරන නව පළිබෝධයා
(1) වයිරසයකි.
(2) දිලීරයකි.
(3) පොතු කෘමියෙකි.
(4) කුරුමිණියෙකි.
(5) මයිටාවෙකි.